ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 9 කාණ්ඩය 2 2012 දෙසැම්බර්

# කුඩා තේ හිමියන්ගේ අතමිට සරු කිරීමට B Leaf - 60%

**ප්‍රශ්නය : B Leaf - 60% යනුවෙන් නම්කර ඇති වැඩ පිළිවෙළ ගැන පැහැදිලි කළොත් ?**

පිළිතුර : B Leaf - 60% කියන්නේ ශ්‍රී ලංකාවේ තේ නිශ්පාදන ක්‍රියාවලියේ භාවිතාවන අමුද්‍රව්‍යය වන අමු දළුවල ගුණාත්මය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් තේ මණ්ඩලයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති උපායමාර්ගික වැඩ පිළිවෙළ.

**ප්‍රශ්නය: අමු දළු වල ගුණාත්මය ඉහළ දැමීම කියන්නේ දැන් ඒවායේ ගුණාත්මය පිරිහිලාද තියෙන්නේ ?**

පිළිතුර: ඔව්. කර්මාන්ත ශාලාවට ලැබෙන අමු දළු කාණ්ඩ තුනක් යටතේ වර්ග කරනව. නොමේරූ නොතැලුනු දළු - Best) නොමේරූ තැලුනු දළු (BB-Below Best) මේරූ දළු (P-Poor). ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කරනු ලැබූ නිර්නයන් වලට අනුව තේ කම්හල් වලට ලැබෙන අමු දළු වලින් නොමේරූ නොතැලුන දළු - ඒ කියන්නේ හොඳ දළු තියෙන්නේ 33% ක් නොමේරූ තැලුන දළු 32% ක් මේරූ දළු 35% විදිහට. මේ අනුව පැහැදිලි වෙනව අපි අද ඉන්නේ කොතනද කියල. මේ ව්‍යාපෘතිය තුලින් අපි බලාපොරොත්තු වෙනව ලංකාවෙ තේ කම්හල් වලට ලැබෙන හොඳ දළු ප්‍රතිශතය 60% දක්වා වැඩි කරන්න. එයයි අපි B Leaf -60% කියල හඳුන්වන්නේ. මේ බව සඳහන් කරල 2010 දෙසැම්බර් 07 වන දින අංක 1684/48 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් නිකුත් කරල තියෙනව. මේ අනුව සෑම දළු සැපයුම්කරුවෙක්ම නීතිමය වශයෙන් බැඳි සිටිනව තේ කම්හල් වලට අවම වශයෙන් 60% ක වත් හොඳ දළු දෙන්න. ඒ වගේම අනෙක් පැත්තෙන් කර්මාන්ත ශාලාත් බැඳි සිටිනව හොඳ දළු ගන්න.

**ප්‍රශ්නය: ඔබ කිව්වා හොඳ දළු ප්‍රතිශතය අඩුයි කියල. ඇයි මෙහෙම වෙලාතියෙන්නෙ. එය කාගේ වරදින්ද ?**

පිළිතුර: මූලික වශයෙන් මෙහෙම වෙලා තියෙන්නෙ කරුණු දෙකක් නිසා දළු නෙලිමේදි ඇති වන ප්‍රශ්න - වඩාත් පැහැදිලිව කිව්වොත් නිවැරදි කෘෂිකාර්මික පිළිවෙත් වලින් බැහැර වීම මෙන්ම නිවැරදි දළු නෙලිමේ ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම. අනික් කරුණ තමයි පසු අස්වනු හානිය. නිවැරදි දළු නෙලිමේ ප්‍රතිපත්තියක් අනුගමනය නොකලහොත්, නොමේරූ දළු වෙනුවට මේරූ දළුත්, පසු අස්වනු හානිය - ඒ කියන්නේ දළු නෙලා ගැනීමෙන් පසු අවස්ථාවේ සිට කර්මාන්තශාලාවට ගෙන යන තෙක් සිදුවන හානිය - මේ නිසා තැලුනු දළුත් කම්හලට එන්න පුළුවන්.

මේ අනුව කම්හලට හොඳ දළු නොලැබෙන්න තේ වගාකරුවන්, දළු නෙලන්නියන්, දළු එක්රුස් කරන්නන්, ප්‍රවාහනය කරන්නන්, කම්හල් වල දළු නියෝජිතවරුන් හා කම්හල් නිලධාරීන් යන හැමෝම දායක වෙනවා. එබැවින් මේ තත්වය දියුණු කරන්න මේ හැමෝම එකට එකතු වී කටයුතු කරන්න අවශ්‍ය වෙනව.

**ප්‍රශ්නය: වර්තමාන තත්වය මත මේ B Leaf - 60% යන්න යථාර්ථවාදි (Realistic) ඉලක්කයක්ද ?**

පිළිතුර: ඇත්තෙන්ම ඔව්! ඒ මන්ද කියනවා නම් දැනට තියෙන තත්වය අනුව (මා කලින් සඳහන් කළ දත්තයන්ට අනුව) B හා BB කාණ්ඩ එකට එකතු කලොත් එය 65% ක් වෙනවා. ඒ කියන්නේ කේෂ්ත්‍ර මට්මේ දී හොඳ දළු ප්‍රතිශතය 65% ක් වෙනවා. දළු නෙලීම තව පොඩ්ඩක් හදාගත්තොත් කේෂ්ත්‍රයේදි මේ තත්වය 75% කට පහසුවෙන් ගේන්න පුළුවන්. පසු අස්වනු හානිය 50% කින්වත් අඩු කරගන්න පුලුවන්වුනොත් මේ කියන ඉලක්කයට බොහොම පහසුවෙන් යන්න පුලුවන්. අනෙක් එක අප බලාපොරොත්තු වන්නේ වසර 3 ක් ඇතුලත මේ කියන ඉලක්කයට යන්න. එයට මා සඳහන් කල සියලු පාර්ශවකරුවන්ගේ සහයෝගය අවශ්‍ය වෙනව. ඒ වගේම තේ නිපදවන වෙනත් රටවලින් උදාහරණ ගත්තොත් දළු හානිවීම වලක්ව ගන්න නොයෙකුත් සාර්ථක ක්‍රම අනුගමනය කර හොඳ දළු ප්‍රතිශතය 75% කින් එහාට රඳවාගෙන ඉන්නව.

**ප්‍රශ්නය: අමු දළු වල ප්‍රමිතිය නිසි මට්ටමක නොතිබුන හොත්, එය කුඩා තේ වතු හිමියන්ට ආර්ථිකව බලපානවද?**

පිළිතුර: පැහැදිලිවම ඔව්! ඔවුන්ට ලැබිය යුතු මිල නොලැබී යනවා. අමු දළු වල ප්‍රමිතිය අඩුවීම තුළ ද්විතික ශ්‍රේණියේ තේ සහ කසල තේ ප්‍රතිශතය වැඩි වෙනවා. එවිට වෙන්දේසියේ සාමාන්‍ය මිල (NSA) අඩු වෙනව. මාගේ දැනුමේ හැටියට හිතෙනවා පහතරට වගාකරුවෙක් තමන්ගේ අමු දළු වලට අද රු.65/- 70/- වක මිලක් ගන්නවා නම් ඔහුට එනත රු.80/- 85/- ක සැබෑ මිලක් ලබාගැනිමට අවස්ථාව තියෙනවා කියලා. අපි මේ ව්‍යාපෘතිය තුලින් අමු දළු වල ප්‍රමිතිය ඉහල දැමීමට සමත් වූවොත්, නිසැකවම ඔවුන්ගේ අතමිට සරුකරන්නත්, රටට විදේශ විනිමය වැඩි කරන්නත් හැකියාව ලැබෙනව.

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 9 කාණ්ඩය 2 2012 දෙසැම්බර්





කර්මාන්තශාලාවකට ලැබුණු හොඳ තත්වයේ (B කාණ්ඩයේ) අමුදලු

**ප්‍රශ්නය: මේ තත්වය ඇති කරන්න ඔබගේ මැදිහත්වීම කෙබඳුද?**

පිළිතුර: අප තේ පර්යේෂණ ආයතන සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වැනි ආයතන වල සහයෝගය ලබා ගෙන කුඩා තේ වතු හිමියන්, අමු දලු සැපයුම්කරුවන්, දලු වෙළඳුන් සහ කම්හල් ආදිය දැනුවත් කරගෙන යනව. ඒ වගේම නිසි ප්‍රමිතියෙන් යුතු දලු එක්රුස් කිරීමේ මධ්‍යස්ථාන හදාගැනීමටත් නිසි ප්‍රමිතියෙන් යුතු



මෝරපු දළුවලින් (P කාණ්ඩයේ) ලැබෙන නිමි තේ

දලු ඇසුරුම් (මළු හා ප්ලාස්ටික් පෙට්ටි) මිලදී ගැනීමටත් දලු ප්‍රවාහන මාධ්‍යයන්, නවීකරණය කර ගැනීම සඳහා ත් සහනාධාරයක් ලබා දෙනව. ඒ වගේම ඉදිරියේදි ඉහත සඳහන් ආයතනත් සමග එකතු වෙලා එම ක්‍රියාවලින් අධීක්ෂණය කිරීමටත්, ප්‍රමාද වී දලු ප්‍රවාහනය කිරීම (රාත්‍රී 08.30 න් පසු) වැලැක්වීමටත් පියවර ගන්නවා. නිශ්චිත කාලසීමාවකට පසු නිවැරදි කිරීමට අපහසු තැන් නිවැරදි කර ගැනීමට නීතියේ පිහිට පැතිමටත් බලාපොරොත්තුවෙනවා. මේ සියල්ලේම අරමුණ අපේ දලු වලට හොඳ මිලක් ලබා ගැනීම බව යලිත් අවධාරනය කරන්න කැමතියි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහකාර කොමසාරිස් වයි.ජී .ඉන්ද්‍රජිත්
සාකච්ඡාකර සකස් කලේ
ජානක මහින්දපාල